**බිබිල ප්‍රාදේශීය සභාව - 2020**

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

බිබිල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු. 165,450 ක් වුවද එය රු. 112,900 ක් ලෙසට රු. 52,550 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වැරදීමකින් අඩුවෙන් ගිණුම් ගත කර ඇති අතර 2021 වර්ෂයේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 75 ක් තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | සුසාන භූමිවල වටිනාකම තක්සේරු කර 2021 වර්ෂයේ ගිණුම් සකස් කරන විට ගිණුම් ගත කරන බව දන්වා ඇත. | නිවැරදි තක්සේරුවක් සිදු කර නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 8,312,250 ක් වුවද එය රු. 8,188,250 ක් ලෙසට රු. 124,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වැරදීමකින් අඩුවෙන් ගිණුම් ගත කර ඇති අතර 2021 වර්ෂයේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඈ) ප්‍රාදේශීය සභාවට අයත් පොදු ළිං ඉදිකර තිබුණු ඉඩම් කැබැලි 229 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | ඉඩම් කොටස් 229 නිවැරදිව තක්සේරු කර 2021 වර්ෂයේදී ගිණුම් සකස් කරන විට ගිණුමට ඇතුලත් කරන බව දන්වා ඇත. | නිවැරදි තක්සේරුවක් සිදු කර නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.192,815 ක වියදමින් කාර්යාලයේ ඉදිරිපස වහලය ඉදිකිරීමේ වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | කාර්යාලයේ ඉදිරිපස වහලය සකස් කිරීමේ වියදම අතපසුවීමකින් ප්‍රාග්ධනිත නොකළ බවත් 2021 වසරේදී ගිණුම් සකස් කරන විට නිවැරදි කරන බවත් දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.6.2** **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 573,777,067 ක් වූ ගිණුම් විෂයයකට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | සභාව විසින් පත් කළ තාවකාලික තක්සේරු මණ්ඩලයක් විසින් තක්සේරු කිරීම් සිදුකර ඇති අතර ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,646,527 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,090,344 ක් විය.

**2.2** **<u>මූල්‍ය පාලනය</u>**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව රු. 210,299.69 ක් බැංකුවේ "අඩු වූ මුදල" ලෙස ඇතුලත් කර තිබුණද විගණිත දිනය වූ 2021 මාර්තු 10 දින වන විටත් එම ඌනතාවය හඳුනාගෙන අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂය සඳහා සකස් කරන ලද බැංකු සැසඳුම් වාර්තාවල එම වෙනස සොයා ගැනීමට නොහැකි බවත් ඉදිරියේදී එම වෙනස සොයා ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | බැංකු ගනුදෙනුවලදී සිදු වී ඇති ඌනතා හෝ අඩුපාඩු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.3** **<u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>**

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 4,862,804 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් එකතු කිරිම සඳහා වැඩසටහන් සංවිධානය කර තිබුනද කොවිඩ් වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව සඳහන් කර ඇත. | හිඟ වරිපනම් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු දැන්වීම් පුවරු 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතු රු. 118,050 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ගෙවීමට අදාල ආයතන දැනුවත් කර ඇති බවත් ගෙවීම් සිදු නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | ආදායම් පරීක්ෂක නිලධාරීන් විසින් සමීක්ෂණ කටයුතු සිදුකර දැන්වීම් පුවරු හඳුනාගෙන ගාස්තු අයකරගත යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාවට අයවිය යුතු රු. 212,723 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් තිබූ අයගේ ජල සැපයුම් විසන්ධි කර ඇති අතර එම මුදල් අයකරගැනිමට නීති මඟින් කටයුතු කරන බවත් සඳහන් කර ඇත. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 827,083 ක් හා හිඟ මුද්දර ගාස්තුව රු. 6,652,610 ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී බිබිල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් 23 ක් හඳුනාගෙන තිබුණද විගණිත දිනය වූ 2021 මාර්තු 10 දින වන විටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඒවා නතර කරන ලෙස නිවේදන යවා ඇති බවත් ආදායම් පරීක්ෂක මහතුන් මගින් වාර්තා ලබාගෙන නීතිමය කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2021 අප්‍රේල් මස මාසික සභා රැස්වීමට යොමු කර ඇති බවත් අදාල වාර්තා හා අනුමැතිය ලද පසු නඩු පැවරීමට කටයුතු කරන බවත් සඳහන් කර ඇත. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |